# බටහිරයන්ට වෙනස් ව ලෝකය වටා ගිය චීන ජාතිකයෝ

චීනයට මහායාන බුදු දහම භාරතයෙන් ගිය ද එහි අද ඇත්තේ භාරතීය මහායාන බුද්ධාගමක් නොවේ. එක් අතකින් මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ බුදු සමයෙහි ම ඇති නිදහස ය. බුදු සමය, ක්‍රිස්තියානිය හෝ ඉස්ලාම් වැනි විශ්ව ආගමක් නොවේ. විශ්ව ආගමක් යනු දැනුවත් ව මුළු ලෝකයට ම එකම සංස්කෘතියක් හා දහමක් ලබා දීමට උත්සාහ කරන ආගමකි. ඒ ඒ සංස්කෘතිය තුළට ගැලපෙන ආකාරයකට වත් පිළිවෙත් සකස් කර ගැනීමට විශ්ව ආගමක් ඉඩ නොදෙයි. එසේ වුවත් විශ්ව ආගමකට වුව ද ඒ ඒ ආගම වෙනස් වීම වළක්වාලිය හැකි නොවේ. අද වන විට විවිධ ක්‍රිස්තියානි ආගම් මෙන් ම ඉස්ලාම් ආගම ද බිහි වී ඇත. බුදු දහම ලොව පුරා පැතිරී ගොස් ඇත්තේ විවිධ සංස්කෘතීන්ට අනුව වෙනස් වීමට නිදහස ලබා දෙමිනි. අපේ සිංහල බුද්ධාගම අශෝක බුද්ධාගම නොවේ. සිංහල බුද්ධාගමෙහි අපේ පැරණි වෘක්ෂ වන්දනාව ද ඇතුළත් කර ගනිමින් බෝධි වන්දනාවක් ඇත. එහි අනේක දෙවිවරු සිටිති. මේ දෙවිවරුන්ගෙන් සමහරෙක් ඈත අතීතයේ යක්ෂ යුගයේ සිටි නෑ යක්කු වෙති. එමෙන් ම වෛදික දෙවිවරු ද එහි වෙති. විෂ්ණු දෙවියන් ඇතුළු මේ වෛදික දෙවිවරු අපට ලැබුණේ හින්දු ආගමෙන් නොව අවුරුදු තුන්දහසකට පමණ පෙර මෙරටට පැමිණි ආර්ය භාෂා කතා කළ ජනයාගෙනි. ඒ වෛදික දෙවිවරු මෙන් ම නෑ යක්කු ද සිංහල බුද්ධාගමෙහි බෞද්ධ දෙවිවරු බවට පත් වූහ. බොහෝ දෙනා නොදැන සිටිය ද හින්දු ආගම නමින් ආගමක් ඉන්දියාවේ ඇති වුයේ ම හතරවැනි සියවසේ ශංකරාචාර්යයන්ගෙන් පසුව ය. හින්දු ආගම බිහි වී ඇත්තේ වෛදික ආගම්වල, බුදු දහමේ හා ජෛන ආගමේ සංකලනයෙනි. සතුන් බිලි දුන් වෛදික ආගම්වලට අවිහිංසාව ඇතුල් වුයේ බුදු දහමේ හා ජෛන ආගමේ බලපෑමෙනි.

සිංහල බෞද්ධයන් ඇතුළු ථෙරවාදීන්ගේ බුදු හාමුදුරුවන් පිරිනිවන් පෑවේ වී නමුදු මහායාන බුද්ධාගමේ බුදු හාමුදුරුවෝ තවමත් නිවනෙහි වැඩ වාසය කරති. මහායාන බුද්ධාගමෙහි නොයෙකුත් බෝධිසත්වවරු වෙති. සිංහල බෞද්ධයන් පිහිට පතන්නේ දෙවිවරුන්ගෙන් මිස බුදු හාමුදුරුවන්ගෙන් නොවේ. සිංහල බුද්ධාගමෙහි කිසි විටෙකත් කිසිවකුටවත් නිවන් අවබෝධ කර ගැනීමේ දී බාහිර පුද්ගලයකුගෙන් ආධාරයක් බලාපොරොත්තු විය නොහැකි ය. බුදු හාමුදුරුවන් කර ඇත්තේ මග පෙන්වා දීමක් පමණකි. එහෙත් මහායාන බුද්ධාගමෙහි බෝධිසත්වවරු මෙන් ම බුදුවරු ද සත්වයන්ට නිවන් දැකීමට ආධාර කරති. කෙසේ වෙතත් චීනයේ ඇත්තේ කොන්ෆියුෂියස් හා ටාඕ දහම් මහායාන බුදු දහම සමග සංකලනය වූ ආගමකි. එය චීන චින්තනය තුළ නිර්මාණය කර ගනු ලැබූ ආගමක් වෙයි. ස්වභාව ධර්මය සමග බැඳුණු චීන චින්තනය තුළ මාලිමා යන්ත්‍රය නිර්මාණය කර ගත් චීන ජාතිකයෝ ලොව පුරා යාත්‍රා කළහ. ෂෙන් හෝ (සෙන් හේ නමින් ද හැඳින්වෙයි) නම් නාවිකයා යටතේ චීන ජාතිකයෝ ලෝකය ම දැන සිටියහ. යුරෝපීයයන් අපට උගන්වන ඉතිහාසයෙහි සඳහන් අන්දමට ලෝකය වටා මුලින් ම යාත්‍රා කෙළේ ෆර්ඩිනන්ඩ් මැගලන් නම් නාවිකයා ය. එහෙත් එයට පෙර 1421 දී ෂෙන් හෝ නැව් පති ලෝකය වටේ යමින්, කොලම්බස් ඇමරිකාවට යෑමට පෙර ද කැප්ටන් කුක් ඕස්ට්‍රේලියාවට යෑමට පෙර ද ඒ රටවලට ගොස් ඇතැයි ගැවින් මෙන්සීස් නමැත්තා තම 1421, චීනය ලෝකය සොයාගත් වසර යන කෘතියෙහි සඳහන් කර ඇති බව කියැවෙයි. මේ ෂෙන් හෝ නැව්පති කිහිප වතාවක් ලංකාවට ද පැමිණ ඇත. ඔහු විසින් පිහිටුවන ලද සෙල්ලිපියක් ගාල්ලෙන් හමු වී ඇත. ඔහු එක් වරක් පැමිණ ඇත්තේ එවකට ගම්පොළ වැඩ විසූ දළදා වහන්සේ වැඳ පුදා ගැනීමට ය. තවත් වරක් යම් හේතුවක් නිසා යුද්ධයකට පැටලී සිංහල රජ කෙනකු සිරභාරයට ගෙන චීනයට ගෙන ගොස් ඇත. මේ රජු කවු ද යන්න පිළිබඳ ව ඉතිහාසඥයන් අතර මතභේද වෙයි. ඒ රජ කෙනකු ද රජ කෙනකු මෙන් සිංහලයන් විසින් සළකනු ලැබූ පුද්ගලයකු ද යන්න ද තවමත් විසඳී නැත. මේ සම්බන්ධයෙන් මහාචාර්ය මැන්දිස් රෝහණධීර මහතා පළ කර ඇති අදහස් වැදගත් යැයි සිතමි. සිරභාරයට ගනු ලැබූ තැනැත්තා කවුරුන් වුව ද ඔහු අවුරුදු පහකට පසු නිදහස ලබා ආපසු ලංකාවට පැමින ඇති බව ද සඳහන් වෙයි. මෙහි දී අපට වඩා වැදගත් වන්නේ චීන ජාතිකයන් ලෝකය පුරා යාත්‍රා කළ ද, ඔවුන් යුරෝපීයයන් මෙන් තම සංස්කෘතික ආධිපත්‍යය ලොවෙහි ව්‍යාප්ත නොකළ බව ය.

යුරෝපීයයන්ට ලෝකය පුරා තම සංස්කෘතික ආධිපත්‍යය පැතිරවීමට අවශ්‍ය විය. ඒ ඔවුන්ගේ චින්තනයේ ප්‍රතිඵලයකි. කතෝලික ආගම, නොයෙකුත් ක්‍රිස්තියානි ආගම්, ඉස්ලාම් ආගම හා යුදෙව් ආගමට ඇත්තේ එක පසුබිමකි. ඒ සියල්ල පිටුපස මුල් යුදෙව් චින්තනය වෙයි. මුල් යුදෙව් චින්තනයට අනුව යුදෙව්වෝ දෙවියන් වහන්සේ විසින් තෝරා ගනු ලැබූ ජනතාව වෙති. දෙවියන් වහන්සේ විසින් යුදෙව්වන් තෝරා ගනු ලැබුයේ මිනිස් වර්ගයා

© Prof. Nalin De Silva

පවත්වාගෙන යෑම සඳහාත් ලෝකයට ම දෙවියන් වහන්සේගේ පණිවුඩය ලබා දීමටත් ය. මුල් යුදෙව් චින්තනයෙහි මුලට ම තමන් තෝරා ගත් ජනතාව යන අදහස සහ තමන්ට දෙවියන් වහන්සේ විසින් නියම කරනු ලැබූ කාර්යයක් වේය යන්න ඇත. පරණ ගිවිසුමෙහි සඳහන් වන එක් උත්පත්ති කථාවකට අනුව යෙහෝවා දෙවියන් වහන්සේ ලෝකය මවා සතුන් සිවුපාවුන් හා සර්පයන් ද මැවීමෙන් පසුව අවසානයේ දී ආදම් මැවූහ. ඉන්පසු ඒව ද මැවූ දෙවියන් වහන්සේ ඒව ද ඇතුළු සියල්ල ආදම්ට හිමිකර දුන්හ. මේ ලෝක ස්වාමීත්වය පිළිබඳ මුල් යුදෙව් චින්තනයෙහි එන අදහස ය. ආදම්, ඒව ද ඇතුළු සියල්ලෙහි ස්වාමියා විය. වර්තමාන පුරුෂාධිපත්‍යය, ලෝකාධිපත්‍යය ආදිය පැන නැගුනේ මේ චින්තනයෙහි බව පුරුෂාධිපත්‍යය හා පරිසර සංරක්ෂණය ගැන කතා කරන්නෝ නොදනිති. (භාරතීය වෛදික බ්‍රාහ්මණයන් අතර ද ඇතැම් කරුණු සම්බන්ධයෙන් එයට සමීප මතයක් විය.) දෙවියන් වහන්සේ ලෝකය ද, ගහ කොළ ද, සතුන් ද පමණක් නොව ඒව ද මවා ඇත්තේ අවසාන වශයෙන් ගත් කළ ආදම් වෙනුවෙනි. මේ චින්තනය පරණ ගිවිසුමෙහි නෝවා ගේ කතාවෙන් මෙන් ම මෝසස්ගේ කතාවෙන් ද තවත් තහවුරු වෙයි. ආර්ථික හා දේශපාලන ආධිපත්‍ය ද පුරුෂාධිපත්‍යය, පරිසරාධිපත්‍යය ආදිය ද ගැන කතා කරන ඒ තේරුම් ගත හැකි අයට පවා බොහෝ විට නොතේරෙන දෙයක් නම් සංස්කෘතිකාධිපත්‍යය ය. ඉනුදු දැනුම් ආධිපත්‍යය තේරුම් ගනු තබා එවැන්නක් තිබේ ද යන්න පිළිබඳවත් බොහෝ දෙනකුට හැඟීමක් හෝ නැත.

මුල් යුදෙව් චින්තනයෙහි ලෝක ස්වාමීත්වය යන අදහස තිබුණ ද යුදෙව්වන්ට ලෝකය පුරා තම ආධිපත්‍යය පැතිරවීමට නොහැකි විය. මා දකින අයුරින් නම් එයට ප්‍රධාන හේතු දෙකක් වෙයි. එකක් නම් ඒ සඳහා අවශ්‍ය වූ දැනුම එකල යුදෙව්වන්ට නොමැති වීම ය. ලෝකාධිපත්‍යයක් පිහිටුවීම සඳහා යම් මූලික දැනුමක් අවශ්‍ය වෙයි. යුදෙව්වන්ට ඒ දැනුම නිර්මාණය කර ගැනීමට නොහැකි විය. චීන ජාතිකයන්ට ඒ සඳහා අවශ්‍ය දැනුම වූ නමුදු ඔවුන්ගේ චින්තනය ලෝකය පුරා සංස්කෘතික ආධිපත්‍යයකට අනුබල නොදෙන්නක් විය. මා සිතන අයුරින් දෙවැනි කරුණ වූයේ යුදෙව් සංස්කෘතිය සංවෘත ජනකායකගේ සංස්කෘතියක් වීම ය. යුදෙව්වන් සංවෘත ජනකායක් වන්නේ ඔවුන්ගේ ජන වර්ගයට කිසිවකුටවත් පිටතින් ඇතුල් වීමට ඉඩක් නොතිබුණිය යන අරුතින් ය. යුදෙව්වකු වන්නේ උපතිනි. යුදෙව් දෙමව්පියන්ට දාව උපන් අය පමණක් යුදෙව්වෝ වූහ. ආදම් ඒව කතාව මෙන් ම නෝවාගේ කතාව ද මේ බව තහවුරු කරයි.

යුදෙව් චින්තනයෙහි වෙන් කිරීම ප්‍රධාන ලක්ෂණයක් වෙයි. මේ වෙන් කිරීම ඇරඹෙන්නේ ද දෙවියන් වහන්සේ ගෙනි. දෙවියන් වහන්සේ ලෝකය මවා ලෝකයෙන් වෙන් වූහ. දෙවියන් වහන්සේ ලෝකයේ කොටසක් නොවෙති. ලෝකය දෙවියන් වහන්සේගෙන් වෙන් ව පවතියි. වෙන් වූ උන්වහන්සේ හා උන්වහන්සේගේ ම නිර්මාණය වූ මිනිසුන් අතර ඇත්තේ ගිවිසුමකි. මිනිසුන්ට උන්වහන්සේට යාඥා කළ හැකි ය. එමගින් යම් යම් දේ ඉල්ලා ලබා ගත හැකි ය. මිනිසුන්ට යම් දේ ගැන අයිතියක් ඇත. වර්තමාන ලෝකයෙහි ව්‍යාප්ත වී ඇති අයිතිය, ඉල්ලීම, ගිවිසුම ආදිය පදනම් ව ඇත්තේ මේ චින්තනයෙහි ය. මාක්ස්වාදීන්ට නොතේරුණ ද ඉල්ලීම්, අයිතිවාසිකම්, කම්කරු සටන්, ගිවිසුම් ආදිය පිටුපස ඇත්තේ යාඥා සහ අයිතීන් ද පදනම් වූ චින්තනයකි. අපේ චින්තනයෙහි ඇත්තේ ඉල්ලීම් හා අයිතිවාසිකම් නොව යුතුකම් හා වගකීම් ය. ඒ චින්තනය සිගාලෝවාද සූත්‍රයෙන් හෙළි දරවු වෙයි.

යුදෙව්වකු ලෙස බිහි නොවූ වෙනත් අයකුට යුදෙව්වකු වීමට නොහැකි වීම යුදෙව් සංස්කෘතිය හා චින්තනය ලෝකය පුරා ව්‍යාප්ත නොවීමට හේතුවක් විය. යුදෙව්වෝ තමන් අන් අයගෙන් දැඩිව වෙන් කර ගත්හ. වෙනත් පිටස්තරයකුට යුදෙව් සංස්කෘතිය තුළට ඇතුල් වීමට නොහැකි විය. එවැනි පසුබිමක ලොව පුරා යුදෙව් සංස්කෘතිය ව්‍යාප්ත කළ හැකි නොවේ. එකල යුරෝපය පුරා පමණක් නොව ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශවල ද යුදෙව්වන් විසිරී සිටි නමුදු ඔවුහු අනෙක් අය සමග මිශ්‍ර නොවී වෙන් ව වෙනත් ම ජන කොට්ඨාශයක් ලෙස ජීවත් වූහ. චින්තනයෙහි වූ වෙන් කිරීම වැඩි කම නිසා ම ඒ ඒ දෑ අතර සම්බන්ධයන් දැකීමට නොහැකි වීමෙන් දැනුම නිර්මාණය කිරීමේ දී ද යුදෙව්වන්ට බාධා පැමිණියේ ය. යුදෙව් ආගම විශ්ව ආගමක් බවට පත් නොවූයේ ප්‍රධාන වශයෙන් ම යුදෙව් ජනකාය සංවෘත ජනකායක් වීම හේතුකොට ගෙන ය.

යුදෙව්වන් සම්බන්ධ මේ කරුණ හින්දු ආගම සම්බන්ධයෙන් ද යම් ප්‍රමාණයකට අදාළ වෙයි. අද ලෝකය පුරා වසන හින්දු භක්තියන් ගැන සලකා බැලීමේ දී පෙනී යන කරුණක් නම් ඔවුන් එක්කෝ ඉන්දියාවේ වසන හින්දු දෙමව්පියන්ගෙන් පැවතෙන්නන් බව හෝ නැත්නම් ඉන්දියාවෙන් වෙනත් රටවලට සංක්‍රමණය වූ හින්දූන්ගෙන් පැවත

© Prof. Nalin De Silva

එන්නත් බව ය. වෙනත් ආගම් අදහන්නවුන් හින්දු ආගම වැළඳ ගැනීමේ ප්‍රවනතාවයක් දක්නට ඇත්නම් ඒ මෑත භාගයේ බටහිර ඇති වූවකි. හැටේ දශකයේ හා ඉන් පසු බටහිර තරුණ තරුණියෝ විලාසිතාවකට මෙන් බටහිර සංස්කෘතිය එපා වී හරේ ක්‍රිෂ්ණා වැනි කාණ්ඩවලට එක් වූහ. එහෙත් අද ඒ ප්‍රවනතාවය ඒ තරම්න් දක්නට නොලැබෙයි. වෙනත් අය හින්දු ආගම වැළඳ නොගැනීමට ප්‍රධාන හේතුව වෛදික බ්‍රාහ්මණයන් විසින් ඇති කරන ලද දැඩි කුල ක්‍රමය විය හැකි ය. බ්‍රාහ්මණයෝ මිනිසුන් උපතින් කුලවලට බෙදූහ. බ්‍රාහ්මණයකු විය හැකි වූයේ බ්‍රාහ්මණ දෙමව්පියන්ට දාව ඉපදීමෙන් පමණකි. බ්‍රාහ්මණයෝ හා අනෙක් අය, බ්‍රාහ්මණයන්ට අනුව බ්‍රහ්මන්ගේ ශරීරයෙහි විවිධ තැන්වලින් උත්පත්තිය ලැබූහ. වෛදික (හා පසුව හින්දු) සමාජයෙහි මිනිසුන් කුල වශයෙන් බෙදුණු පසු වෙනත් බාහිර පුද්ගලයන්ට එයට ඇතුල් වීමට අපහසු විය. සංස්කෘතියක් උකහා ගත හැක්කේ උත්පත්තියෙන් පමණක් නම් එයට ව්‍යාප්ත වීමට ඇති ඉඩ කඩ ඉතා සීමිත වෙයි.

බටහිර විද්‍යාව ගොඩ නැගෙන්නේ මිනිසා, එනම් බටහිර මිනිසා, මුල් කර ගෙන ය. මුළු මහත් ලෝකය ම මිනිසා වෙනුවෙන් මවා ඇතැයි (මෙය අද මැවී ඇතැයි යනුවෙන් වෙනස් කර ගන්නවා විය හැකි ය.) බටහිරයෝ විශ්වාස කරති. ආදම්ගෙන් පැවත එන මිනිසාට මුළු ලොවෙහි ම ස්වාමීත්වය හිමි නම් මුළු ලොවම මවා ඇත්තේ මිනිසාගේ ප්‍රයෝජනයට නම් පරිසරය ගසා කෑමේ වරදක් නැත. මිනිසා වෙනුවෙන් අනෙක් සතුන්ට හිංසා කරමින් ඒ සතුන් බටහිර විද්‍යාවේ පරීක්ෂණ සඳහා යොදා ගැනීමේ වරදක් නැත. බටහිර විද්‍යාව යනු මානව කේන්ද්‍රීය, එනම් යුරෝ ඇමරිකානු කේන්ද්‍රීය, දැනුම් පද්ධතියක් වෙයි. බටහිර විද්‍යවේ අවසාන මිනුම් දණ්ඩ වනුයේ බටහිර මිනිසා ය. බටහිර මිනිසාට වැඩක් වීම, බටහිර මිනිසාගේ ජීවන ක්‍රමය ඔවුන්ගේ සිතුම් පැතුම්වලට එකඟ ව, එනම් සංවර්ධනය පිළිබඳ ඔවුන්ගේ නිර්වචනයට අනුව, ඉහළ යෑම ආදිය පදනම් කර ගනිමින් බටහිර විද්‍යවේ අධ්‍යයන, ගවේෂණ ආදිය සිදු කෙරෙයි. පරිසරය පිළිබඳ අද බටහිර යම් අවධානයක් ඇති බව සැබෑ ය. එහෙත් ඒ අවධානය මුළුමනින් ම බටහිර මානව කේන්ද්‍රීය වෙයි. අද බටහිරයන් පරිසරය රැක ගැනීමට කතා කරන්නේ පරිසරයට ඇති ඇල්මක් නිසා නොව පරිසරය දූෂණය වීම බටහිර මිනිසාට ප්‍රශ්නයක් වී ඇති නිසා ය. පරිසරය රැක ගැනීමට කතා කරන්නේ ඊනියා තිරසාර සංවර්ධනයක් වෙනුවෙනි. බටහිරයන්ට අනුව පරිසරය මිනිසා සඳහා මිස පරිසරය සඳහා නොවේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva